# <u>WEATHER FORECAST FOR 25 DECEMBER 2019</u>

**<u>(Issued at 12.00 noon on 24 December 2019)</u>**

**Showery condition over the island is likely to temporarily reduce to some extent from tomorrow (25 December).**

Several spells of showers will occur in the Northern, North-Central, Uva and Eastern provinces and in Hambantota district. Showers or thundershowers will occur at a few places elsewhere after 1.00 p.m.

Light showers may occur in the Central province during the morning too.

Misty conditions can be expected at some places in Western, Central and Sabaragamuwa provinces during the morning.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

දිවයින පුරා පවතින වැසි තත්ත්වය හෙට දිනයේ (දෙසැම්බර් මස 25) සිට තාවකාලිකව තරමක් දුරට අඩුවන ලකුණු පවතී.

උතුරු, උතුරුමැද, ඌව සහ නැගෙනහිර පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයේත් වැසි වාර කිහිපයක් ඇතිවන අතර දිවයිනේ සෙසු ප්‍රදේශවල ප.ව. 1.00 න් පමණ පසුව ස්ථාන කිහිපයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

මධ්‍යම පළාතේ උදෑසන කාලයේදීද සිහින් වැසි ඇතිවිය හැක.

බස්නාහිර, මධ්‍යම සහ සබරගමුව පළාත්වල උදෑසන කාලයේදී ඇතැම් ස්ථානවල මීදුම් සහිත තත්ත්වයක් බලාපොරොත්තු විය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## <u>WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 24 December 2019)</u>

Showers or thundershowers will occur at several places in the sea areas extending from Kankasanturai to Hambanthota via Trincomalee and Batticaloa.
Showers or thundershowers will occur at several places in other sea areas during the afternoon or night.

Winds will be North-easterly and speed will be **(20-40) kmph** in the sea areas around the island.

**Temporarily strong gusty winds (up to 70-80 kmph) and very rough seas can be expected during thundershowers.**

<u>ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය</u>

<u>2019 දෙසැම්බර් මස 24 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදී.</u>

කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල තැනින් තැන සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දෙසින් හමා එන අතර සුළගේ වේගය පැ.කි.මී. (20-40) පමණ වේ.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල (පැ.කි.මී. 70-80 දක්වා) තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

AMRodrigo
කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date: 2019/12/24
Time: 1217hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE